නිවේදනය

මෙම අමාත්‍යාංශයෙහි පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම පිණිස ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

එක් එක් තනතුරු සඳහා පහත ආකෘතිය අනුව පිලියෙල කරගත් අයදුම්පතක් මඟින් සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කෙරෙන සහතික සමඟ පහත සඳහන් ලිපිනය වෙත 2020.11.25 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

අදාල කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කල යුතුය.

1. පුරප්පාඩුව පවතින තනතුර
   I. නිශ්චල ඡායාරූප ශිල්පී
   II. වීඩියෝ කැමරා ක්‍රියාකරු
   III. සහාය කැමරා ක්‍රියාකරු

2. තනතුරේ ස්වභාවය :තනතුර තාවකාලික තනතුරක් වන අතර,ස්ථිර පත්වීමක් ලබාගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි.

3. තාවකාලික පදනම යටතේ බඳවා ගැනීමට අනුමත තනතුරු සංඛ්‍යාව හා තනතුරු සඳහා නියමිත කාර්යයන්

| අනුමත තනතුරු | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| 1. නිශ්චල ඡායාරූප ශිල්පී | 01 | 1. නිශ්චල ඡායාරූප ගැනීම හා මුද්‍රණය.<br>2. මුද්‍රණ හා ඡායාරූප රසායනාගාර භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු.<br>3. ඡායාරූප ලේඛනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු.<br>4. ඡායාරූප ලේඛන පවත්වාගෙන යාම හා එහි නඩත්තු කටයුතු.<br>5. ඡායාරූප අංශයේ ඉන්වෙන්ට්‍රිය හා ගබඩා භාරව කටයුතු කිරීම.<br>6. වීඩියෝ ඡායාරූකරණය.<br>7. පොටෝ ගෙමිටු ක්‍රමයට ඡායාරූප ගැනීම හා ඩිජිටල් ක්‍රමයට අනුව ඡායාරූප සකස් කිරීම.<br>8. පරිගණක ආශ්‍රිත මුද්‍රණය හා ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාලව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| 2. වීඩියෝ කැමරා ක්‍රියාකරු | 01 | 1. වීඩියෝ කිරීම, විශේෂ වැදගත්කමකින් යුතු අවස්ථා ඡායාරූප කිරීම හා සංස්කරණය.<br>2. සංස්කරණ උපකරණ හා සංස්කරණය මැදිරිය භාරව කටයුතු කිරීම හා එහි නඩත්තු කටයුතු.<br>3. වීඩියෝ පට ලේඛනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු.<br>4. වීඩියෝ පට ලේඛනයක් පවත්වාගෙන යාම හා සුවිගත කිරීම.<br>5. වීඩියෝ කැමරා අංශයේ ඉන්වෙන්ට්‍රිය හා ගබඩා භාරව කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| | | 6. ඇස්තමේන්තු සකස් කිරීම.<br>7.ඕනෑම වර්ගයකට අයත් කැමරාවක් පරිහරණය කිරීම, ඩිජිටල් ක්‍රමයට අනුව රූප රාමු ලබා ගැනීම.<br>8. පරිගණක ආශ්‍රිත සංස්කරණය හා ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාලව පවරනු ලබන අනෙකුත් කාර්යයන්. |
| 3. සහාය කැමරා ක්‍රියාකරු | 01 | 1. කැමරා ශිල්පියාට අවශ්‍ය පසුබිම සකස්කර දීම.<br>2. අවශ්‍ය ආලෝකකරණයේ ස්වාභාවය හඳුනා ගැනීම.<br>3. කැමරාගත කිරීම සඳහා අවශ්‍ය කෝණ හඳුනාගැනීම.<br>4. හඬ පටිගත කිරීම.<br>5. කැසට්පට සංස්කරණය කිරීමට සහාය වීම. |

4. නිශ්චල ඡායාරූප ශිල්පී හා වීඩියෝ කැමරා ක්‍රියාකරු තනතුර සඳහා බඳවා ගැනීමේ සුදුසුකම්:

4.1 අධ්‍යාපන සුදුසුකම් :අ.පො.ස. (සා.පෙළ.) විභාගයේදී ගණිතය සහ සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව ඇතුළුව අවම වශයෙන් විෂයයන් 04 කට සම්මාන සහිතව එක් වරකදී විෂයන් 06 කින් සමත්ව තිබීම.

4.2 වෘත්තීය සුදුසුකම් :ඡායාරූපකරණය පිළබඳව ජාතික වෘත්තීය සුදුසකම් (NVQ) මට්ටම 5ට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම.

4.3 පළපුරුද්ද : ඡායාරූපකරණය පිළබඳව අවුරුදු 03 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

4.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

4.5 වෙනත් සුදුසකම් : 1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
3. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කලයුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට, එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

5. වීඩියෝ කැමරා ක්‍රියාකරු සහයක තනතුර සඳහා බඳවා ගැනීමේ සුදුසුකම්:

5.1 අධ්‍යාපන සුදුසුකම් :අ.පො.ස. (සා.පෙළ.) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිත විෂයන් 06 ක් සමත් වී තිබීම.

5.2 වෘත්තීය සුදුසුකම් :අදාළ නොවේ.

5.3 පළපුරුද්ද : අදාළ නොවේ.

5.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

5.5 වෙනත් සුදුසකම් : 1. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
2. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කලයුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට, එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
3. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

6.වයස : අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

7.බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 නිශ්චල ඡායාරූප ශිල්පී හා වීඩියෝ කැමරා ක්‍රියාකරු :ප්‍රායෝගික පරීක්ෂණයක් හා ව්‍යුහගත පරීක්ෂණයක් මඟින් අයදුම්කරු බඳවා ගනු ලැබේ.

7.1.1 ප්‍රායෝගික පරීක්ෂණය

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිශ්චල ඡායාරූප ශිල්පී<br>1.කැමරාවක් ක්‍රියාකරවීම හා රූපගත කිරීම.<br>2.ආලෝකය සැපයීම හා නවීන තාක්ෂණික ක්‍රම භාවිතය.<br>3.පැහැදිලි ඡායාරූප ගැනීම. | 60<br>20<br>20 | 40% |
| එකතුව | 100 | |
| වීඩියෝ කැමරා ක්‍රියාකරු<br>1.වීඩියෝ කැමරා සහ ඊට අදාල උපකරණ ක්‍රියා කරවීම.<br>2.වෘත්තීය ආවරණයට සුදුසු පරිදි දර්ශන තෝරා ගැනීම හා දත්ත එක්රැස් කිරීම.<br>3.රූපවාහිනී දර්ශණවලට අදාළව ස්වාභාවික ආලෝකය උපයෝගී කර ගැනීම හා රූපගත කිරීම සඳහා විදුලි ආලෝකය යෙදීම.<br>4.පරිගණක තාක්ෂණය භාවිතයෙන් ප්‍රවෘත්ති සංස්කරණය පිළිබඳ හැකියාව.<br>5.කැසට් පට පටිගත කිරිමේ තාක්ෂණය හා ඊට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම<br>6.රූපවාහිනී මැදිරි තුළ රූගත කිරීම පිළිබඳ සාමානය දැනුම | 30<br>20<br>20<br>10<br>10<br>10 | 40% |
| එකතුව | 100 | |

7.1.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය 100% | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 25 | |
| වෘත්තීය පළපුරුද්ද | 30 | |
| | 10 | |
| භාෂා ප්‍රවීනතාවය | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | 05 | |

සටහන - ප්‍රායෝගික පරීක්ෂණය සමත් අයදුම්කරුවන් අතුරින් ව්‍යුගත සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය යන දෙකෙන්ම ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනු පිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

7.1.3 ව්‍යුගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්

7.2 වීඩියෝ කැමරා ක්‍රියාකරු සහායක: ව්‍යුහගත සම්මුඛ පරීක්ණයේ දීම සුදුසුකම් ද පරීක්ෂා කරනු ලැබේ.

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය 100% | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | අදාළ නොවේ |
| වෘත්තීය සුදුසුකම් | 15 | |
| පළපුරුද්ද | 50 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | 05 | |
| | 100 | |

සටහන - ව්‍යුගත සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා අනුපිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

7.2.1 ව්‍යුගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්

7.3 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය - ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මඟින් හා අමාත්‍යාංශ වෙබ් පිටුවේ පළ කිරීමෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ලේකම්
වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය
1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය

**වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ නිශ්චල ඡායාරූප ශිල්පී/ වීඩියෝ කැමරා ක්‍රියාකරු/ සහාය කැමරා ක්‍රියාකරු තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත**

1. පෞද්ගලික තොරතුරු

1.1 නම:-

1.2 උපන් දිනය :-

1.3 ලිපිනය (ස්ථිර) :-

1.4 ලිපිනය (තාවකාලික) :-

1.5 ස්ත්‍රී / පුරුෂ භාවය :-

1.6 දුරකථන අංකය :-

1.6.1 ජංගම

1.6.2 ස්ථාවර

2. අධ්‍යාපන සුදුසුකම් :-

විභාගය :- ප්‍රතිඵල:- වර්ෂය :-

3. වෘත්තීය සුදුසුකම් :-

| | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |

4. පළපුරුද්ද :-

| | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |

5. වෙනත් සුදුසුකම් :-

| | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | | |

ඉහත තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

............................
දිනය

........................................
අත්සන